ඇලෙක්සි තොල්ස්තෝයි

කඟ හොටා

ඩබ්ලියු.ඒ.අබේසිංහ

රුසියන් ළමා කතා 11

කහ හොටා

ඇලෙක්සි තොල්ස්තෝයි

අනුවාදය

ඩබ්ලියු. ඒ. අබේසිංහ

චිත්‍ර නිර්මාණය

වෙනියාමින් කොස්ටින්සින්

සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ

කහ හොටා

© ඩබ්ලියු.ඒ. අබේසිංහ

ISBN : 978-955-680-655-7

පළමු මුද්‍රණය - 2000
දෙවැනි මුද්‍රණය - 2006
තෙවැනි මුද්‍රණය - 2017

චිත්‍ර නිර්මාණය
වෙනියාමින් කොස්ටිත්සින්

පරිගණක අක්ෂර සංයෝජනය
සෙව්වන්දි ප්‍රියංකා ජයරත්න

ප්‍රකාශනය :- **සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ**

සමුද්‍ර කොන්සොලිඩේටඩ් පුද්ගලික සමාගම
නො.1141 මරදාන පාර,
කොළඹ 08,

දුර :- 011 - 2671951 ෆැක්ස් :- 011 - 2695280

e-mail : publications@samudrabooks.com
web : www.samudrabooks.com

චිදා උදේ හොඳ ලස්සනට ඉර පායලා තිබුණා. ඉර අව්ව මිදුල පුරාම පැතිරිලා, හොඳට උණුසුමත් දැනෙනවා. සීතලක් ඇත්තෙත් නැහැ. ගෙදර පෝටිකෝවත් බිත්තියත් අයිනෙ තියෙන්නෙ, අපූරු තණගොල්ලක්. කහහොටා, මේ තණගොල්ලෙ අයිනකට වෙලා ඉන්නවා. එක පාරටම උෆ දැක්කා, නිකිතා ඒ පැත්තට එනවා. කහහොටා බයේ ගැහෙව්ව පටන්ගත්තා.

කහ හොටාගෙ හිස සිනිදු පුංචි පිහාටු බූසියකින් වැහිලා. උගෙ බෙල්ල පේන්නේම නෑ. උගෙ හොටේ පහළටම කළු පාටට ඉරක් ඇඳිලා තියෙනවා. ඒ නිසයි, උෆට කහ හොටා කියලා කියන්නේ. උගෙ පිහාටු බූසිය අවුල් වෙලා. බඩ යටින් තියෙන පිහාටු නිසා, උගෙ කකුල් දෙකත් වැහිලා ගිහිල්ලා වගෙයි.

නිකිතා හෙමින් සැරේම, කහ හොටා ඉන්න තැනට ඇවිත්, ඌ අල්ලගන්ඩ පාත් වුණා විතරයි, එතකොටම කහ හොටා උගෙ පුංචි හොට ඇරියා. මොකටද දන්නවද? නිකිතා බය කරන්ඩ. නිකිතා, එහෙම බය වෙන ළමයෙක් නෙමෙයි. නිකිතා හෙමින් සැරේ පාත් වෙලා, අත් දෙකෙන්ම කුරුලු පැංචා අල්ලගත්තා.

කහ හොටා බයේ ගැහෙන්ඩ පටන්ගත්තා. ඌ පුංචි නිසා, තගවමත් උගෙ පිහාටු හොඳට පාට වැටිලාවත් නැහැ. ඒ පිහාටු යන්තමට ගුරු පාටයි. මේ කුරුලු පැංචට වෙලා තියෙන දේ දන්නවද? ඌ කූඩුවෙන් බිමට වැටිලා. තාම ඉගිල්ලෙන්ඩ බැරි හින්දා, ආපහු කූඩුවට යන්නත් බැහැ. ඉතින් ඒ නිසා තමයි, තණගොල්ලට වෙලා බයෙන් ගැහි ගැහී හිටියේ.

"දැන් ඉතින් මාව ඉවර තමයි. මේ ළමයා මාව එක පාරටම ගිල දමාවි." කහ හොටාට හිතෙන්නෙ එහෙමයි. පණුවෙක්, මැස්සෙක්, දළබුවෙක් අහු වුණාම, පුංචි වුණත් කහ හොටා දන්නවා, ඒ සත්තු ගිල දමන හැටි. "ඉතින් මේ ළමයා මාවත් එක කටටම ගිල දමාවි," කහ හොටා තමාටම කියාගත්තා.

ළමයා තමාගේ කට ළඟටම කුරුලු පැටියා ඔසොවාගත්තා. කහ හොටාගේ ඇස් දෙක දැල බැන්දා වගේ අඳුරු වෙලා ගියා. උගේ පිහාටු සෙලවෙන්ඩ පටන්ගත්තෙ, වේගයෙන් හදවත ගැහෙන්ඩ වූ නිසයි. නිකිතා, කුරුලු පැංචගෙ හිසට කටින් පිඹලා, ඌ එක අතකින් අරගෙන ගේ ඇතුළට ගියා.

"මේ ළමයට තවම බඩගිනි නැතුව ඇති. මාව පස්සෙ කන්ඩ වෙන්නැති," කහ හොටා තමාටම කියාගත්තා.

අයියා ලස්සන චූට් කුරුලු පැටියෙක් අතේ තියාගෙන ගේ ඇතුළට එන හැටි බලාගෙන හිටියෙ, ඇලෙක්සැන්ද්‍රා ලියෝන්තීව්නා. පුංචි ඇලෙක්සැන්ද්‍රා, අයියා අතින් කුරුලු පැටියා ඉල්ලගෙන, උගෙ හිසට පිඹින්ට වුණා.

"ඌ හරිම චූටියිනෙ අයියෙ." ඇය කීවා. "හරිම ලස්සන කහපාට හොට."

ළමයින් දෙන්නා එකතු වෙලා, පුංචි පැටියා, ජනේලය උඩින් තියලා, ජනේල පියන් දෙකම ඇරලා, ඌ දිහා බලගෙන හිටියා. ජනේලයට දැල් රෙදි ගහලා තියෙන නිසා, ඌට එළියට එන්ඩ හැටියක් නැහැ. ඒ වුණත් කහ හොටා, දැල් රෙද්දට නගින්ඩ වෑයම් කළා. තමන්ගේ ජීවිතය, මේ විදිහට නිකම්ම අතහැරලා දාන්ඩත් බෑනේ. සටනකුත් දෙන්ඩ එපායැ. ඒ වුණාට, මේ හිච්චි පැටියා, කොහේ කියලා ඉගිල්ලෙන්ඩද?

සුදු පාට දැලෙන් එහා පැත්තේ, කොළ සෙලවෙන්ඩ පටන්ගත්තා. ගේ කුරුල්ලෝ, චූටික්කෝ, බට්ටිච්චෝ, මේ සේරම කුරුල්ලො ඇවිදින් ගස්වල වහලා, සෙල්ලම් කරනවා. මල් පඳුරුවල අතු ඉති සෙලවෙනවා. ඒ වුණාට මට එහාට ඉගිල්ලිලා යන්ඩ බැහැ. මං ඉවර තමයි, කහ හොටා තමන්ට කියාගත්තා.

මේ අතර නිකිතාගේ පුංචි ඇස් දෙක කුරුලු පැටියා දිහාවටම යොමු වෙලයි තිබුණේ. මේ ළමයා තමාව මෝහනය කරගෙන ඉන්නව වගේ කියලයි, කහ හොටාට දැනුණෙ.

දැන් ඉතින් හැන්දෑ වෙලා. මේ තරම් කාලය ගත වෙලත් තමාව නොකාපු එක ගැන, කහ හොටාට හරිම පුදුමයි. ඒ අතර නිකිතා, පණුවො, මැස්සො වගෙ පුංචි සත්තු අහුලගෙන ඇවිල්ලා, දැලට උඩින් දැම්මා. "හරි හරි මාව හොඳට මහත් උණාම කන්ඩ වෙන්ඩැති," කුරුලු පුංචා කල්පනා කළා.

තමා ළඟට දමාපු රතුපාට පණුවෙක් ඇඹරෙන්ඩ වුණා. "ඌ නියම පණුවෙක් වෙන්ඩ බෑ. මේක හරිම උගුලක්. මම ඌව කටේවත් තියන්නෙ නෑ." කහ හොටා හිත හදාගත්තා.

ගස් අතරින් හිරු බැස ගියා. අළු පැහැති විදුලි එළිය නිසා කහ හොටාගේ ඇස් දෙකත් බර වෙලා, ඌට නිදිමත දැනුණා. ඒත් ඌ නිදාගන්නේ නැතුව කකුල් දෙකෙන් ජනේල පඩිය තදින් බදාගෙන හිටියා. තවත් ටික වෙලාවක් ගත වුණා. දැන් කිසිම දෙයක් පෙනෙන්නෙ නෑ. හොඳටම කළුවරයි. ගෙවත්ත පැත්තෙන් කුරුල්ලන්ගෙ හඬ ඇහෙන්නෙත් නෑ. තණගොල්ලෙන් හමා ගෙන ආ මිහිරි සුවඳක් කහ හොටාට දැනෙන්ට වුණා. දැන් ඉතින්, උගේ ඇස් දෙක හොඳටම නිදිබර වෙලා. කුරුලු පුංචා ඇහැ ඇරගෙන ඉන්න කොයි තරම් වෑයම් කළත්, හරි ගියේ නෑ. අන්තිමේදි කහ හොටාට හොඳටම නින්ද ගියා.

උදේ වටින් ගොඩින් එළිය වැටෙන කොට, ගේ කුරුල්ලන්ගේ කීච් බීච් සද්දයට උෆ ඇහැරුණා. කුරුල්ලො ලිලැක් පඳුරේ තෙත අතු රිකිලි උඩ ඉඳගෙන රණ්ඩු වෙනවා. තෙත වුණ කොළ ගොන්න මත හිරු එළිය වැටිලා ලස්සනට බබළනවා. ඈත ඉඳන් නොයෙක් නොයෙක් කුරුලු නෑදෑයින්ගේ සින්දු ගායනා ඇහෙනවා.

"දැන් නම් හොඳටම බඩගිනියි. බඩගින්නේ ඉඳලම මට දැන් ඇති වෙලා," කහ හොටා හෙමින් හෙමින් කොඳුරන්ඩ පටන්ගත්තා. ජනේල පඩිය උඩ හිටිය පණුවා, කහ හොටාට ඉඛේටම පෙනුණා. උෆ වලිග කොටේ ජනේලයට හේත්තු කරගෙන, හොඳට හුස්ම අල්ලලා, තමාගේ හොටෙන් පණුවට කොටලා ගිල දැම්මා. "හොඳ රහයි. නරකක් නෑ," උෆට හිතුණා. උගෙ බඩගින්න ටිකක් අඩු වුණා.

ඔන්න ඒත් එක්කම අඩි සද්දයක් ඇහෙනවා. නිකිතා ජනේලය ගාවට ඇවිල්ලා, එයාගෙ විසාල අතෙන් දැල් තිරය පාත් කරලා, පණුවොයි, මැස්සොයි අහුරක්ම ජනෙල් පඩිය උඩට අත හැරියා. කහ හොටා බයේ ගැහි ගැහී ජනෙල් පඩියේ මුල්ලකට අයින් වෙලා බලාගෙන හිටියා. ළමයගෙ අත තමාගෙ හිසට උඩින් තියෙනවා, පුංචි කුරුලු පැටියට තේරුණා. ඒ වගේම ළමයා එයාගෙ ලොකු දීප්තිමත් ඇස් දෙකෙන් තමා දිහා බලාගෙන ඉන්න හැටිත් උෆට පෙනුණා.

නීකිතා ගියාට පස්සේ, කහ හොටා තටු ගසා දාලා එහෙම, මේ විදිහට කල්පනා කරන්ඩ වුණා. "එතකොට එයා මාව කෑවෙ නෑ. ඕනැ නම් එයාට මාව කන්නත් තිබුණා. එයා කුරුල්ලො කන්නෙ නැතුව ඇති. එහෙනම් බය වෙන්ඩ තරම් කාරණයක් ඇත්තෙ නෑනෙ."

කහ හොටා, තමන්ට ලැබුණු කෑම සේරම කෑවා. ඊට පසසේ හොටෙන් පිහාටු පිරිමැදලා, ජනෙල් පඩිය උඩ, පැන පැන යන්ඩ පටන්ගත්තා. දැල් තිරය එහා පැත්තෙන්, උෆට අනිත් කුරුල්ලො දැකගන්ඩ පුළුවන් වුණා. වයසක ගේ කුරුල්ලෙක් එහා පැත්තෙ ඉන්නවා.

කහ හොටා සිවුරුහන් බාමින්, ගේ කුරුල්ලට ඔච්චම් කරන්ඩ වුණා. "පියුට්.... චිලික් චිලික්... පියුට්..." ගේ කුරුල්ලට හොඳටම කේන්ති ගිහිල්ලා, හොටත් ඇරගෙන කහ හොටා ඉන්න දිහාවට වේගයෙන් පියාඹාගෙන ආවා. ඒත් උෆට, කුරුලු පුංචට කොටන්ඩ බෑනේ. දැල් තිරය තියෙන නිසා. "හොඳයි, පුළුවන් නම් මට කොටනවා," කියලා කහ හොටා ජනෙල් පඩියට පාත් වුණා.

ආයෙත් වරක්, නිකිතා ආවා. ඒ සැරේ මොකවත් අරගෙන ආවෙ නෑ. නිකිතා එයාගෙ අත කහ හොටා ළඟට කිට්ටු කළා. උෆ එක පාරටම පැනලා, නිකිතාගෙ අතට කෙටුවා. ආයෙත් පිටිපස්සට ගිහිල්ලා සටනට සූදානම් වෙලා හිටියා. නමුත් නිකිතා කිසිම දෙයක් කෙළේ නැහැ. ළමයා කට ඇරලා, ''හා හා හා,'' කියලා හිනා වෙන්ඩ පටන්ගත්තා විතරයි.

ඒ දවසත් ගත වුණා. බය වෙන්ඩ දෙයක් ඇත්තෙ නෑ. කෑමත් හොඳයි. එකම ප්‍රශ්නයකට තියෙන්නෙ, පාළු ගතිය විතරයි. කහ හොටා රෑ වෙන තුරු බලාගෙන ඉඳලා, ඉර බැස ගියාට පස්සේ, හොඳටම නිදාගන්නවා.

පහුවදා උදේ ආහාරයෙන් පසුව, කහ හොටා සොයලා බැලුවා, දැලට පිටිපස්සෙන් පැනලා යන්න පුළුවන්ද කියලා. ඌ ජනේලෙ හැමතැනම පැන පැන බැලුවා. එළියට යන්ඩ තරම් ඉඩක් හෝ හිදැසක් හෝ දකින්ඩ ඇත්තෙ නෑ. ඊට පස්සෙ ඌ දිසියට පැනලා, ඒක ඇතුළට හොට දාලා, ඇති වෙනකල් වතුර බීගෙන බීගෙන ගියා. ඒක උඩ තිබුණු කුඩා බෝලයක් වාගේ දෙයකුත් ගිල දැම්මා.

ඒ දවස හුගාක් දිග දවසක්. නිකිතා පණුවන් අහුලාගෙන ආවා. ඇවිත්, තාරා පිහාටුවකින් ජනෙල් පඩිය පිහලා දැම්මා. අර තට්ටෙ තියෙන ගේ කුරුල්ලා, වටු කුරුල්ලෙක් එක්ක රණ්ඩු වුණා. වටු කුරුල්ලාට කොයි තරම් තදින් පහර වැදුණාද කියනවා නම්, ඌ හරියට ගල් ගෙඩියක් වැටෙනවා වාගෙ, බිම වැටුණා.

මේ අතර පොල්කිච්චෙකුත් ජනේලය ගාවට පියඹාගෙන ආවා. ඇවිත්, කිසිම හේතුවක් නැතුව ජනේලෙට කොටන්ඩ පටන්ගත්තා. ඊට පස්සෙ ඌත් ඉගිල්ලිලා යන්ඩ ගියා.

රොබින් කුරුල්ලෙක් හුඟාක් වෙලා සින්දු කියන්ඩ පටන්ගත්තා. ඌ හිරු එළිය ගැනත්, මී වදවල තියෙන පැණි ගැනත් සින්දු කියන්ඩ වුණා. කහ හොටාට තමා ගැන බොහොම දුක හිතුණා. මටත් සින්දු කියන්ඩ ඇත්නම්. ඌ උගුර පෑදුවට, සින්දු ආවෙ නෑ. ගොර ගොර සද්දෙ විතරයි. ජනෙල් පඩියක් උඩට වෙලා, හිරකාරයෙක් වගේ ඉඳගෙන මොන සින්දුද?

කහ හොටා, ආයත් වතාවක්, වටපිට බලලා, ජනේල පඩිය උඩ එහාට මෙහාට යන්ඩ පටන්ගත්තා. තමාට ගැලවිලා යන්ඩ හැටියක් තියෙනවද බලන්ඩ. මොන ගැලවිල්ලක්ද? ඒ පාර, ඌ දැක්කේ මහ බයානක සතෙක්. මේ සතා දැල් තිරයට එහා පැත්තෙ ඉඳලා, හෙමින් සීරුවෙ උගෙ මිටි සිනිදු අඩි තිය තියා බිම දිගේම ආවා. ඌට තිබුණෙ රවුම් ඔළුවක්. මූණෙ රැවුල්ගස් තුන හතරකුත් කෙලින් වෙලා තියෙනවා. ඇස් දෙක නිල්ම නිල් පාටයි. හරිම නපුරු විදිහට තමයි, ඌ බලාගෙන

හිටියෙ. මොකටත් හෙලවෙන්ඩවත් හොඳ නෑ කියලා, කහ හොටාට හිතුණා. උෆ ජනේල පඩිය උඩටම වෙලා, කිසිම සද්දයක් බද්දයක් නැතුව හිටියා.

ගෙදර අය මේ බළලාට කතා කෙළේ, වැසිලි වැසිලියේච්චි කියලා. උෆ එක පාරටම ජනේලයේ අයිනට පැනලා, දැල් රෙද්දට ඉස්සරහ ගාත් දෙක තියාගෙන, කටත් ඇරගෙන කහ හොටා දිහා බලාගෙන හිටියා. මගෙ දෙයියනේ. උෆගේ කට කොයි තරම් විසාලද? තමාගෙ හොටටත් වඩා උල් වෙච්ච දත්, මේ යකාට තියෙනවා නේද කියලා, කහ හොටා හොඳටම බය වුණා. බළලා, උගෙ ඉස්සරහ ගාත් දෙකෙන් දැල් රෙද්ද ඉරුවා. කහ හොටාට දෙයියන් සිහි වුණා. උගෙ තටු දෙකත් නිකම්ම ඇකිලුණා....

ඔන්න ඉතින්, හරියටම ඒ වෙලාවේ, නිකිතා එතනට ආවා. බළලගේ පිටිහමින් උෆ උස්සගත්තු නිකිතා, උෆව දොර ගාවට අල්ලලා වීසි කළා. වැසිලි වැසිලියේවිච් වලිගෙත් නමාගෙන, තරහෙන් පුරු පුරු ගගා දුවන්ඩ වුණා.

මේ සිද්ධියෙන් පස්සෙ, කහ හොටාට මෙහෙම කල්පනා වුණා.

"නිකිතාට වඩා ශක්තිමත් සතෙක් ඇත්ත නෑ."

ඊළඟ වතාවෙ නිකිතා ළඟට ආවම, එයාට තමාගෙ හිස අතගාන්ඩ ඉඩ දීලා, කහ හොටා නිසොල්මනේ හිටියා. ඒත් ටිකක් බයෙන් තමයි.

මේ විදිහට ඒ දවසත් ගත වෙලා ගියා. පහුවදා උදේ වෙන කොට, කහ හොටාගෙ දුක්මුසු ගතිය නැති වෙලා ගිහින්. උෆ ජනෙල් පඩියෙන් බිමට පැනලා, කාමරේ හැමතැනම ඇවිදින්ඩ පටන්ගත්තා. අවට තියෙන්නෙ මොනවද කියලා බලන්ඩ. උෆ දැක්කා, බළලා පැනලා, දැල් රෙද්දෙ ඇති කරපු හිල. හිලෙන් එළියට ඔළුව දාලා බැලුවා. ඊට පස්සෙ දැල් රෙද්ද උඩට නැගලා, එළියට පැනලා, ගෙදර සාලෙට ඇතුළු වුණා. කහ හොටාට හරිම සතුටුයි. උෆ අත්තටු එහෙම ගහලා, පියාඹන්ඩ වෑයම් කළා. දැන් උෆට ටිකක් ඉගිල්ලෙන්ඩත් පුළුවන්.

කහ හොටා දොර ගාවට ඇවිත්, ඊට පස්සෙ අල්ලපු කාමරේට ඇතුළු වුණා. කවුදෝ හතර දෙනෙක් එවුම් මේසයක් ළඟ වාඩි වෙලා ඉන්නවා කහ හොටා දැක්කා. ඒගොල්ලො ලොකු ලොකු දේවල් කමින් හිටියා. ඒ හතර දෙනාම තමන් දිහා හැරිලා බලනවා, උෆට පෙනුණා. කහ හොටා කල්පනා කළා, දැන් ටිකක් නවතින්ඩ ඕන කියලා. නමුත් උෆට තමාගේ පියාපත් පාලනය කරගෙන මේසෙට උඩින් නැවතිලා ඉන්ඩ බැරි වුණා. කහ හොටා මේසෙ උඩට වැටුණා. උෆ ජෑම් දීසියත් සීනි පුකුරුවත් මැදට වැටුණා. නිකිතා එතන ඉඳගෙන කෑම කෑවා. කහ හොටා කිසිම නිනව්වක් නැතුව, ජෑම් දීසිය උඩට පැන්නා. ඊට පස්සෙ නිකිතාගෙ උරහිස උඩට පැනලා, අත්තටු අකුලගෙන හිටියා.

නිකිතාගේ උරපත්ත උඩට වෙලා, කහ හොටා සෑහෙන වෙලාවක් හිටියා. සීලිමට පියාඹලා මැස්සෙක් අල්ලගත්තා. ඊළඟට ඉටිපන්දම් රඳවනයට පැනලා, එහෙ මෙහෙ කැරකෙන්ඩ පටන්ගත්තා. දැන් කුරුලු පුංචට හොඳටම බඩගිනියි. ඒ නිසා, ආයෙත් ජනේල පඩිය උඩට නැගලා, එතන දමලා තිබුණ පණුවන් ටික කාලා ඉවර කළා.

හැන්දෑ කාලය වන විට, නිකිතා ගෙදර ආවේ, පුංචි ලී කූඩුවකුත් අරගෙන. ඒකේ පුංචි පෝටිකෝවක්, දොරක් සහ ජනෙල් දෙක තුනක් තියෙනවා. නිකිතා, කූඩුව ජනෙල් පඩිය උඩ තිබ්බා. මේ කූඩුවට කහ හොටා කැමති වුණා. ඌ ඒක ඇතුළට ගියා. ආයෙත් පිටතට ආවා. ඇතුළ අඳුරුයි. ඌට හොඳට නිදාගන්නත් පුළුවන්. ඉතින් කහ හොටා මේ ලස්සන පුංචි කූඩුව ඇතුළට ගිහිල්ලා, හොඳට නිදාගත්තා.

එදාම රාත්‍රියේ, වැසිලි වැසිලියේවිච් - ඒ කියන්නේ ගෙදර බළලා - හිටියේ, ස්ටෝරු කාමරේ. කරන්ඩ හදාපු අපරාධයට දඬුවමක් හැටියට, ඌ ඒ කාමරේට දාලා දොර වහලයි තිබුණේ.ඌ මීයෝ අල්ලන්නෙත් නැතුව, මුළු රාත්තිරිය පුරාම ඹ්‍රාව් ඹ්‍රාව් කියන්ඩ පටන්ගත්තා. බළලගේ හිතට හරි නෑ. ඌ හිටියේ බොහොම අපහසුවෙනුයි.

දැන් මේ ගෙදර සත්ව රාජධානියෙ තුන්වැනියෙකුත් ඉන්නවා. ගෙදර ඉන්න වැසිලි වැසිලියේවිච් කියන බළලා, ඉත්තෑවා යන මේ දෙන්නාට අමතරව, දැන් කහ හොටාත් ඉන්නවා.

කහ හොටා මේ ගෙදර හිටියේ, තමන්ට ඕනෑ විදිහට. තමන්ගේ හිතුමතේට. ඌ බොහොම දක්ෂයි. ඌ ගෙදර අයගෙ කතාබහටත් සවන් දෙනවා. ඌ, ඇතැම් වෙලාවට මිහිරි තාලෙකට "සාශා" කියලා කතා කරනවා. එහෙම කියලා ඔළුව නමනවා. ඉතින් ඇලෙක්සැන්ද්‍රා ලියොන්තීව්නා හිතන්නේ, කුරුලු පුංචා කතා කරන්නෙ තමන්ට කියලා. කොයි වෙලාවක හරි කහ හොටා දැක්කාම, පුංචි ඇලෙක්සැන්ද්‍රා මෙහෙම කියනවා.

"ආයුබෝවන්, ආයුබෝවන්, කුරුලු පැංචො. උඹ සනීපෙන් නේද?" කහ හොටා ඇලෙක්සැන්ද්‍රාගේ ගවුමේ චිල්ලිලා, ඊට පස්සෙ ඇඟ පුරාම පැන පැන යනවා.

මේ විදිහට, හේමන්ත කාලය එන තුරුම, කහ හොටා ඒ ගෙදර හිටියා. දැන් උෆ ලොකුයි. තටු දෙකේ කළු පාට පිහාටුත් හුඟාක් තියෙනවා. උෆට රුසියන් බාසාවත් කතා කරන්ඩ පුළුවනි. උෆ වත්ත පුරාම ඉගිල්ලිලා ඇති වුණාම, හැන්දෑවේ ජනෙල් පඩිය උඩ තියෙන උගෙ පුංචි ගෙට ඇතුළු වෙලා නිදාගන්නවා.

ඔන්න ඉතින්, අගෝස්තු මාසෙත් ආවා. වත්තෙ ඉන්න අනිත් කුරුල්ලො උෆට අඬ ගහලා කිව්වා, තමන් එක්ක ජීවත් වෙන්ඩ එන්ඩ කියලා. මේ කුරුල්ලො එකතු වෙලා, කහ හොටාට හොඳට පියාඹන්ඩත් කියලා දුන්නා. කහ හොටාටත් හිතුණා, ඒ ලෝකය මීට වඩා හොඳ ඇති නේද කියලා.

ඉතින්, එක දවසක් කහ හොටා, අනිත් කුරුල්ලොත් එක්ක පියාඹලා යන්න ගියා. උෆ මුහුදු හරහා ඉගිල්ලිලා, අප්‍රිකාවේ පදිංචි වුණා.



ඇලෙක්සි තොල්ස්තෝයි

කහ හොටා

ඩබ්ලියු.ඒ.අබේසිංහ

චිත්‍ර නිර්මාණය - වෙනියාමින් කොස්ටින්සින්

සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ

සමුද්‍ර කොන්සොලිඩේටඩ් පුද්ගලික සමාගම
1141 - මරදාන පාර, බොරුල්ල, කොළඹ 8.
දුරකථන : 011-2671951 ෆැක්ස් : 011-2695280
E-mail : publications@samudrabooks.com
Web : samudrabooks.com
රු. 120/=

ISBN 978-955-680-655-7